ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No } .
ඔබේ අංකය / உமது இல. / Your No }
දිනය / திகதி / Date } 2023.11.01

පැමිණිලි පාර්ශවය : ලක්ෂ්මිණී කුමාරි කලුආරච්චි මිය,
මුල්ගම්පොල,
මහනුවර.

වගඋත්තර පාර්ශවය : විදුහල්පති,
මහ/උසස් බාලිකා විද්‍යාලය,
මහනුවර.

<u>පැමිණිලි අංකය - HRC/KND/76/23/I</u>

පැමිණිල්ල :-

ඉහත පැමිණිලිකාරිය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, තම දියණිය වන ප්‍රබුද්ධිනි නෙතුලි සේරසිංහ දියණිය මහනුවර උසස් බාලිකා විද්‍යාලයේ 2023 වසරේ පළමු ශ්‍රේණියට ඇතුළත් කිරීම සඳහා 'ආසන්නතා පදනම' යටතේ අයදුම්පත් යොමු කිරීමට අනුව VC-39 යටතේ සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වී ඉන් ලකුණු 71 ප්‍රමාණයක් ලැබූ බවත්, කරනු ලැබූ අභියාචනය අනුවද එම ලකුණු වල වෙනසක් නොවූ බවත්ය. පාසලට ආසන්න ඇතුළත් විය හැකි වෙනත් පාසල් සඳහා ලකුණු අඩු කිරීමේ දී, විමලබුද්ධි, මහානාම, සීතාදේවි, ධර්මරාජ හා ස්වර්ණමාලි යන පාසල් සඳහා ලකුණු අඩු කරන ලද නමුදු එම එකදු පාසලක හෝ කතෝලික ආගම ඉගැන්වීම නොකරන බවත් දක්වා ඇත. තම දරුවා කතෝලික භක්තිකයෙකු වන අතර කතෝලික ධර්මය උගන්වනු ලබන්නේ මහ/ උසස් බාලිකා විද්‍යාලයේ පමණක් වන අතර, ඉහත ලකුණු ඉවත් කරන ලද පාසල් වල කතෝලික ධර්මය ඉගැන්වීම් සිදු නොකරන බවද දක්වා ඇත. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය හා අභියාචනා පරීක්ෂණ මණ්ඩලය තම අයදුම්පත සලකා බැලීමේදී, ඉහත පාසල් සඳහා ලකුණු අඩුකරන ලද අතර, 'ආගමික අනුපාතය මත පාසලට ඇතුළත් කිරීමට හැකිදැයි සලකා බැලීමට' අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලය නිර්දේශ කළද, ඒ පිළිබඳ සැළකිල්ලක් නොදක්වා තම ළමයා විද්‍යාලයට ඇතුළත් කිරීම අනෙකුත් වගඋත්තරකරුවන් විසින් ප්‍රතික්ෂේප කරන ලද බවද දක්වා ඇත. තවද තමාට වඩා වැඩි දුරකින්



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office } අංක 14, ආර්.ඒ.ද මෙල් මාවත, කොළඹ-04. / இல.14, ஆர்.ஏ.டி.மெல் மாவத்தை, கொழும்பு-04. / No.14, R.A. De Mel Mawatha, Colombo-04.
සභාපති / தவிசாளர் / Chaiman } 011-2505551
ෆැක්ස් / தொலைநகல் / Fax } 011-2505541/74
ඊමේල් / மின்னஞ்சல் / Email } sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone } 94-11-2505580/81/82
ලේකම් / செயலாளர் / Secretary } 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline } 1996
වෙබ් / இணையம் / Web } www.hrcsl.lk

පදිංචි වෙනත් ආගම් අනුව (රෝමානු කතෝලික නොවන) දරුවන් 04 දෙනෙකු ඇතුළත් කිරීමට එරෙහිව තමා විසින් විරෝධතා ඉදිරිපත් කරන ලද බවත්, ඔවුන් ඇතුළත් කර ඇත්තේ, 'රෝමානු කතෝලික නොවන' ගණය යටතේ වන බවත්, උසස් බාලිකා විද්‍යාලයට රෝමානු කතෝලික යටතේ ළමුන් ඇතුළත් කර නොගන්නා බවත් දැනුම් දීම හේතුවෙන් රෝමානු කතෝලික භක්තිකයෙකු වන තම දරුවාට තම ආගම ඉගෙන ගැනීමට ඇති අවස්ථාව අහිමි වී ඇති බව පැමිණිල්ලේ තවදුරටත් සඳහන් කර ඇත.

**වගඋත්තරකාර විදුහල්පතිවරයාගේ ලිඛිත කරුණු දැක්වීම :-**

පැමිණිලිකාරියගේ දරුවා ආසන්නතාව ගණය යටතේ උසස් බාලිකා විද්‍යාලයට ඇතුළත්වීම සඳහා අයදුම්පත් යොමු කිරීමෙන් අනතුරුව සම්මුඛ පරීක්ෂණයේදී 28/2022 දරණ චක්‍රලේඛනයේ 7.2.4 වගන්තිය අනුව ආසන්න පදිංචි ගණයේ "පාසලට ආසන්නතාවය" අනුව ලබාදෙන උපරිම ලකුණු 50 න් 25 ක් සමඟ මුළු ලකුණු 71 ලෙ ලබා දී ඇති බවත්, ඒ අනුව පළමු සම්මුඛ පරීක්ෂණයේ අවම ලකුණු නොලැබීම මත කරන ලද අභියාචනය අනුව ලකුණු වෙනසක් නොවී මුළු ලකුණු 71 ප්‍රමාණයක් ලැබී ඇති බවත් දක්වා ඇත.

පැමිණිලිකාරිය විසින් රෝමානු කතෝලික නොවන (NRC) ගණය යටතේ තේරී පත්වූ ළමුන් 4 දෙනෙකුට එරෙහිව විරෝධතා ඉදිරිපත් කරන ලද නමුත් ඔවුන් තෝරාගෙන ඇත්තේ, රෝමානු කතෝලික නොවන (NRC) යටතේ වන බවත්, මෙම පාසල රජයට පවරා ගන්නා අවස්ථාවේ සිට මේ දක්වා ළමුන් ඇතුළත් කර ඇත්තේ, 'රෝමානු කතෝලික නොවන' පදනම මත බවත් දක්වා ඇත. මෙම පැමිණිලිකාරිගේ දරුවා 'රෝමානු කතෝලික නිකායට අයත් වන' (RC) අතර මෙම පැමිණිලිකාරිය විසින් සිය අයදුම්පත ඉදිරිපත් කර ඇත්තේ, පාසලට "ආසන්න පදිංචිකරුවන්ගේ දරුවන්" ගණය යටතේ වන බව දක්වා ඇත. තවද ගැටඹේ මහානාම මහා විද්‍යාලයේ රෝමානු කතෝලික ධර්මය විෂය ඉගැන්වීම සිදුකෙරෙන අතර, එය අයදුම්කරුට ආසන්න පාසලක් වන බවද සඳහන් කර ඇත.

**නිරීක්ෂණ :-**

පැමිණිලිකාරිය විසින් ඇයගේ දරුවා වන නෙතුලි සේරසිංහ මහ/උසස් බාලිකා විද්‍යාලයට ඇතුළත් කිරීම සඳහා ආසන්නතා ගණය යටතේ යොමු කරන ලද අභියාචනය අනුව 2022.10.12 දින මූලික සම්මුඛ පරීක්ෂණය සිදුකර,

1. ඡන්ද හිමි නාම ලේඛනයේ ලියාපදිංචිය සඳහා ලකුණු 25
2. පදිංචිය තහවුරු කරන ලේඛන සඳහා ලකුණු 16
3. පදිංචිය තහවුරු කරන අතිරේක ලේඛන සඳහා ලකුණු 05
4. පාසලට ආසන්නතාව සඳහා ලකුණු ලබා දීමේදී පෝෂක ප්‍රදේශය තුළ ඇති පාසල් 05 ක් සඳහා 25 ක් අඩුකර ඒ සඳහා ලකුණු ලබා දී නොමැති අතර, මුළු ලකුණු 71 පාසලට ආසන්නතාවය සඳහා ලකුණු 0 ක්ද වශයෙන් ලකුණු 71 ක් ලබා දී ඇති බව නිරීක්ෂණය වේ.

එසේම, ලකුණු වැඩිකර ගැනීම සඳහා කරන ලද අභියාචනයට අනුව සම්මුඛ පරීක්ෂණයෙන් ලබාදුන් ලකුණු වෙනසක් වී නොමැති අතර, එම ලකුණු 71 ම ලබාදී ඇත.

අභියාචනයට අමතරව පැමිණිලිකාරිය විසින් ඇයට වඩා දුරින් පදිංචි වී අඩු ලකුණු ලබාගෙන තෝරාපත්කර ගත් VC-342 (ලකුණු 48.5),VC-257(ලකුණු 45.4),VC-233(ලකුණු 44),VC-267(ලකුණු 28.4) යන අයදුම්කරුවන්ට එරෙහිව කරන ලද විරෝධතාවයේදී සඳහන් කර ඇත්තේ, එකී ළමුන් තෝරාගෙන ඇත්තේ, රෝමානු කතෝලික නොවන ගණය (NRC) යටතේ බව විදුහල්පති විසින් ඉදිරිපත් කර ඇති වාර්තාවේ දක්වා ඇත.

අභියාචනා මණ්ඩලය විසින් ළමයා ආගමික අනුපාතය යටතේ තෝරාගැනීමට සලකා බලන ලෙසට නිර්දේශ කර ඇති නමුත් ඒ පිළිබඳ කිසිදු සැලකිල්ලක් ගෙන නොමැති බව තවදුරටත් නිරීක්ෂණය වේ.

පැමිණිල්ලට අදාළ කරුණු ඉදිරිපත් කරමින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ලේකම් වන පී.වී.සී. පහලවිතාන මහත්මිය සඳහන් කර ඇත්තේ, මහ/උසස් බාලිකා විද්‍යාලය 1968 වර්ෂයේදී රජයට පවරා ගන්නා ලද අවස්ථාවේදී 'රෝමානු කතෝලික නොවන' ගණය යටතේ විදුහලට 1% ප්‍රමාණයක් ළමුන් ඇතුළත් කළ හැකි නමුත් රෝමානු කතෝලික යටතේ ළමුන් ඇතුළත් කිරීමට හැකියාවක් නොමැති බවයි.

තවද වගඋත්තර පාර්ශවය විසින් සඳහන් කර ඇත්තේ, ඇයට ආසන්නම පාසල වන ගැටඹේ මහානාම විදුහලෙහි රෝමානු කතෝලික ආගම විෂයක් ලෙස උගන්වන බැවින් ඇයට එකී ආගම් අනුපාතයට අනුව ඇතුළත්විය හැකි ආසන්නතම පාසල ගැටඹේ මහානාම විදුහල බවයි.

එහෙත්, පැමිණිලිකාරිය විසින් සිය කරුණු ඉදිරිපත් කිරීමේදී දක්වා ඇත්තේ, එම විදුහලේ කතෝලික ආගම ඉගැන්වීම සිදු නොකරන බවත්, ඒ සඳහා ගුරුවරු වෙන්කිරීමක් සිදුකර නොමැති බවත්ය. ඒ සම්බන්ධයෙන් වඩාත් තහවුරු කිරීම සඳහා පැමිණිලිකාරිය විසින් කරන ලද තොරතුරු ඉල්ලීමකට අනුව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, මහනුවර විසින් යොමු කර ඇති 2023.03.31 ලිපියට අනුව,

1. මහනුවර මහානාම විදුහලේ කතෝලික ධර්මය හදාරන දරුවන් ගණන විෂය සඳහා ගුරුවරයෙකු අනුමත කිරීමට තරම් ප්‍රමාණවත් නොවන බැවින් එම විෂය අනුමත ගුරු ලේඛනයට ඇතුළත් කර නොමැති බවත්,
2. මහනුවර උසස් බාලිකා විදුහලේ කතෝලික ධර්මය සඳහා එක් ගුරුභවතෙකු සිටින අතර, ඊට අමතරව පාසල් සංවර්ධන සමිතියේ ගෙවීම් යටතේ ද්‍රවිඩ හා ඉංග්‍රීසි මාධ්‍ය ගුරුභවතුන් දෙදෙනෙකු කතෝලික ධර්මය උගන්වනු ලබන බවත් දක්වා ඇත.

තවද, පළමු වසරින් පසු එනම් 2 ශ්‍රේණියේ සිට කතෝලික ධර්මය (RC) සඳහා උසස් බාලිකා විද්‍යාලයට ළමුන් ඇතුළත් කර ඇති බවත්, ඒ අනුව 2023 වසරේ දත්ත අනුව 2ශ්‍රේණිය සිට 13 ශ්‍රේණිය දක්වා කතෝලික ආගම සඳහා ළමුන් 20 දෙනෙක් ඉගෙනුම ලබන බවත් අනාවරණය වී ඇත.

ඉන් තහවුරු වනුයේ, 2 ශ්‍රේණියේ සිට රෝමානු කතෝලික දරුවන් මෙම පාසලට ඇතුළත් කරගෙන ඇති බවයි. මේ අනුව 1 ශ්‍රේණියට රෝමානු කතෝලික දරුවන් ඇතුළත් නොකිරීමත්, 2 වන ශ්‍රේණියේ සිට රෝමානු කතෝලික දරුවන් ඇතුළත් කර ගැනීමත් කුමන පදනමක් මත සිදුකරන්නේද යන්න ගැටළුකාරී වේ.

රෝමානු කතෝලික නොවන හෝ රෝමානු කතෝලික යන ආගම් අනුපාත තෝරාගනු ලබන්නේද ආසන්නතාවය අනුව ලැබූ ලකුණු පදනමින් වන අතර, ආසන්නතාවයට ලකුණු නොලැබූ අයවලුන්ගේ ළමයින්, ආගම අනුපාතයට අනුව තෝරාපත් කර ගනු ලබන බව නිරීක්ෂණය වේ. ඒ අනුව පැමිණිලිකරු ලකුණු 71 ලබා ආසන්නතාවය පදනම යටතේ පාසළට ළමුන් ඇතුළත් කරගැනීමේ අවම ලකුණු සීමාව වන ලකුණු 80 ලබාගෙන නොමැති වීම මත පාසලට තේරිපත් වී නොමැති නමුත් අභියාචනා මණ්ඩලය නිර්දේශ කර ඇත්තේ "ආගම අනුපාතය අනුව ඇතුළත් කිරීමට හැකිදැයි සලකා බැලීමට නිර්දේශ කරන බවයි." නමුත් පැමිණිලිකාරියගේ දරුවා රෝමානු කතෝලික දරුවෙකු වීම යන කාරණය මත වගඋත්තර පාර්ශවය ඒ සම්බන්ධයෙන් නිසි අවධානයක් යොමු නොකිරීම හේතුවෙන් පැමිණිලිකාරියගේ දරුවාට පාසලට ඇතුළත් වීමට තිබූ අවස්ථාව අහිමි වී ඇති බව තවදුරටත් නිරීක්ෂණය විය.

1968 වර්ෂයේ පාසල රජයට පවරා ගන්නා අවස්ථාවේ චක්‍රලේඛනය අනුව රෝමානු කතෝලික දරුවන් ඇතුළත් නොකළ යුතුය, යන්න සඳහන් කළද එම චක්‍රලේඛනය කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර නොමැත. එවැනි චක්‍රලේඛනයක් වෙතොත් පරීක්ෂණයෙන් පසුව හෝ ඉදිරිපත් කරන ලෙස උපදෙස් දුන්නද, එවැන්නක් ඉදිරිපත් කර නොමැත.

නිගමනය :-

මෙම පැමිණිලිකරුගේ දරුවා වගඋත්තරකාර විද්‍යාලයේ පළමු ශ්‍රේණියට ඇතුළත් කර ගැනීමේදී අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ අනුව ආගමික අනුපාතය යටතේ සලකා නොබැලීමට හේතු වශයෙන්, 'ආගමික අනුපාතය අනුව රජයට පාසල් පවරා ගැනීමේදී කතෝලික ගණය යටතේ තෝරා නොගත යුතුය' යන්න චක්‍රලේඛනයේ සඳහන් වන බවට වගඋත්තරකරුවන් විසින් දක්වා ඇත. කෙසේ වෙතත්, පාසලේ 2 ශ්‍රේණියේ සිට එම ගණය එනම්, කතෝලික ගණය යටතේ ළමුන් කතෝලික ධර්මය හදාරන බව අනාවරණය වී ඇත.

මෙහිදී වගඋත්තර පාර්ශවය එවැනි චක්‍රලේඛයක් මෙතෙක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර නොමැති අතර, පළමු වන ශ්‍රේණියට ළමුන් ඇතුළත් කර ගැනීමේදී කතෝලික ගණය යටතේ සලකා බැලීමක් නොකළද 2 ශ්‍රේණියේ සිට 13 වන ශ්‍රේණිය දක්වා දරුවන් කතෝලික ධර්මය හදාරනු ලබන බව පෙනීගොස් ඇත. මෙය කුමන පදනමක් මත සිදුවූයේද යන්න වගඋත්තර පාර්ශවය පැහැදිලි කිරීමක් සිදුකර නොමැත. තවද අභියාචනා පරීක්ෂණ මණ්ඩලයේ නිර්දේශය ප්‍රකාරව පැමිණිලිකාරියගේ අයදුම්පත ආගමික අනුපාතය යටතේ සලකා නොබැලීම සාධාරණීකරණය කරමින් තවදුරටත් වගඋත්තරකරුවන් සඳහන් කර ඇත්තේ, මහ/උසස් බාලිකා විද්‍යාලයේ කතෝලික ධර්මය සඳහා පළමු ශ්‍රේණියට ළමුන් ඇතුළත් කර නොගන්නා බවත්, කතෝලික ධර්මය ඉගැන්වීම

සිදුකරනු ලබන මහානාම විද්‍යාලය පැමිණිලිකරුට ආසන්නතම පාසල වන බවත්ය. එහෙත්, පැමිණිලිකරු විසින් ඉදිරිපත් කර ඇති තොරතුරු ඉල්ලීමකට අනුව, ප්‍රමාණවත් ශිෂ්‍ය සංඛ්‍යාවක් නොමැති වීම හේතුවෙන් මහානාම විද්‍යාලයේ කතෝලික ධර්මය ඉගැන්වීම් සිදු කිරීමට ගුරුවරයෙකු අනුමත කර නොමැති බවත්, වගඋත්තරකාර මහ/උසස් බාලිකා විද්‍යාලයේ කතෝලික ධර්මය උගන්වන එක් ගුරුවරයෙකු සහ පාසල් සංවර්ධන සමිතියේ ගෙවීම් යටතේ ඉංග්‍රීසි හා දෙමළ මාධ්‍ය සඳහාද ගරුභවතුන් දෙදෙනෙකු ඉගැන්වීම් කටයුතු සිදුකරන බවත් පැහැදිලි වේ. මේ අනුව වගඋත්තර පාර්ශවය විසින් ඉදිරිපත් කරන ලද මහානාම විද්‍යාලය කතෝලික ධර්මය ඉගැන්වීම් සිදුකරනු ලබන පැමිණිලිකාරියගේ ආසන්නතම පාසල බවට කරුණු දැක්වීම පිළිගත නොහැක.

මේ අනුව පැමිණිලිකාරියගේ දරුවාට තම ආගම වන කතෝලික ධර්මය හැදෑරීමට පවතින පාසල වගඋත්තරකාර මහ/උසස් බාලිකා විද්‍යාලය වන අතර, එම පාසල අහිමි වීම තුළින් කතෝලික භක්තිකයෙකු වන පැමිණිලිකාරියගේ දරුවාට තම ආගමට මෙන්ම ආගමික පරිසරයට වෙනස් වූ ධර්මයක් හැදෑරීමට සිදුවීම තුළින් අගතියට පත්විය හැක.

තවද, 28/2022 දරණ පාසල් වල පළමු ශ්‍රේණියට දරුවන් ඇතුළත් කරගැනීමේ චක්‍රලේඛනයේ 6.1.III අනුව පදිංචි ස්ථානයේ සිට පාසලට ඇති ආසන්නතාවය සලකා බැලීමේදී, “අදාළ දරුවාට ඇතුළත් විය හැකි ප්‍රාථමික අංශ සහිත වෙනත් රජයේ පාසල් වෙනුවෙන් ලකුණු ඉවත් කිරීමේදී, අදාළ ළමයා අයිති ආගම වෙනුවෙන් 10% ක් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් ඇතුළත් කරගනු ලබන වෙනත් රජයේ පාසල් වෙනුවෙන් ලකුණු ඉවත් කළ යුතු බවට” සඳහන් වේ. එහෙත් පැමිණිලිකාරියගේ දරුවා වෙනුවෙන් ලකුණු ඉවත් කිරීමේදී, එකී පාසල් අතර දරුවා අයිති ආගම වෙනුවෙන් 10% ට වැඩි ප්‍රතිශතයක් සිසුන් ඇතුළත් කර ගන්නා පාසල් නොවන බවද නිරීක්ෂණය වේ. ඒ අනුව පදිංචිය සඳහා ලකුණු ඉවත් කිරීම නිවැරදි නොවන අතර, ඒ අනුවද වගඋත්තර පාර්ශවය විසින් පදිංචි ස්ථානයට ආසන්න රජයේ පාසල් සඳහා ලකුණු ඉවත් කිරීමේදී, පැමිණිලිකාරිය වෙත අගතියක් සිදුකර ඇති බව තහවුරු වේ.

මෙම කරුණු අනුව, කතෝලික ධර්මය ඉගැන්වීම් සිදුකරනු ලබන පැමිණිලිකාරියගේ ආසන්නතම පාසල වල වගඋත්තරකාර මහ/ උසස් බාලිකා විද්‍යාලයට පැමිණිලිකාරියගේ දරුවා ඇතුළත් කර නොගැනීම තුළින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාවේ “නීතිය පසිඳලීම හා නීතිය ක්‍රියාත්මක කිරීමේදී නීතියේ රැකවරණයද සර්ව සාධාරණ විය යුතු අතර ආගම, භාෂාව,කුලය, ස්ත්‍රී /පුරුෂ භේදය මත වෙනස්කමට භාජනය නොවිය යුතුයි” යන්න වගඋත්තර පාර්ශවය විසින් උල්ලංඝනය කර ඇත.

**ඒ අනුව, පහත සඳහන් නිර්දේශ කර සිටී.**

මේ අනුව, පැමිණිලිකාරියගේ දරුවා වන ප්‍රබුද්දිනි නෙතුලි සේරසිංහ දැරිය මහනුවර උසස් බාලිකා විද්‍යාලයේ 2023 වසරේ 1 ශ්‍රේණියේ සඳහා ඇතුළත් කිරීමට වගඋත්තරකරු විසින් කටයුතු කළ යුතුය.

2023.11.30 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී දෙහිදෙණිය,<br>
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),<br>
සභාපති,<br>
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා,<br>
කොමසාරිස්,<br>
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය<br>
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)<br>
සභාපති<br>
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා<br>
ජ්‍යෙෂ්ඨ නීතිඥ<br>
කොමසාරිස්<br>
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත :-

01. සුසිල් ප්‍රේමජයන්ත මහතා,<br>
ගරු අමාත්‍යතුමා,<br>
අධ්‍යාපන අමාත්‍යාංශය,<br>
ඉසුරුපාය, බත්තරමුල්ල.

02. අධ්‍යක්ෂ (ජාතික පාසල්)<br>
අධ්‍යාපන අමාත්‍යාංශය,<br>
ඉසුරුපාය, බත්තරමුල්ල.

B/